# මිලින්ද මොරගොඩ එතෙර දේශනයක

ලොව විශාලතම ශීඝ්‍රගාමී භාණ්ඩ ප්‍රවාහන සමාගම වන ෆෙඩරල් එක්ස්ප්‍රස් හි මැද පෙරදිග, ඉන්දීය උප මහාද්වීපය හා අප්‍රිකානු කලාපයේ රටවල් සඳහා පැවැත්වෙන වාර්ෂික සමුළුවේ ආරාධිත විශේෂ දේශනය පැවැත්වීම සඳහා මිලින්ද මොරගොඩ මහතා ඇරයුම් ලැබ සිටී. රටවල් හැටක පමණ ෆෙඩෙක්ස් හි විධායක නිලධාරීන් සහභාගී වන මෙවර සමුළුව මැයි 30 ද තුර්කියේදී පැවැත්වේ. මිලින්ද මොරගොඩ මහතා සිය දේශනය "චීනයේ අපනයනාභිමුඛ ආර්ථික වර්ධනය, එහි අවස්ථා සහ අභියෝග" මැයෙන් පවත්වයි.

ෆෙඩෙක්ස් ඉසුරුමත් 500 සමාගම් ගණයට අයත් ලොව විශාලතම ශීඝ්‍රගාමී ප්‍රධාන සමාගම වන අතර වාර්ෂික පිරිවැය අමෙරිකානු ඩොලර් බිලියන 25 ඉක්මවයි. 2005 වසරේ ෆොචූන් සඟරාව ෆෙඩෙක්ස් ලෝකයේ සමාගම් අතර 8 වන ස්ථානයේ සිටින බව නිවේදනය කර ඇත.